කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී දෙවන වසර උපාධි පරීක්ෂණය
පළමු සෙමෙස්තරය - 2018/2019

# CMS 2114 - චලනීය ප්‍රතිරූපයේ භාෂාව

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

01. 'ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ද්විත්වයක් වන සිනමාව හා රූපවාහිනිය ඒවාට ආවේණික ස්වලක්ෂණවලින් යුක්ත ය.' විවරණය කරන්න.

02. කැමරා රූප සහ කැමරා කෝණ (Camera Shots and Camera Angles) සිනමා හා රූපවාහිනී නිර්මාණවලදී මතුකරන සන්නිවේදනාර්ථ යෝග්‍ය නිදර්ශන ඇසුරින් පැහැදිලි කරන්න.

03. 'සිනමා රූප සංරචන විධික්‍රම (Cinema Visual Composition Methods) සිනමා නිර්මාණයක අර්ථ නිරූපණය කෙරෙහි මෙන් ම සිනමා සෞන්දර්යය කෙරෙහි ද බලපායි.' විග්‍රහ කරන්න.

04. සිනමා හා රූපවාහිනී නිර්මාණාත්මක භාෂාව පෝෂණය කිරීමෙහි ලා ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කරණය උපයෝගී කරගත හැකි ආකාරය යෝග්‍ය උදාහරණ සහිත ව විවරණය කරන්න.

05. කුලෂොව් ප්‍රයෝගය සහ මොන්තාජ් න්‍යාය (Kuleshov effect and Montage theory) සිනමා සෞන්දර්යවේදය කෙරෙහි සිදු කළ බලපෑම සෝවියට් රුසියානු සිනමාව ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

06. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක් (02)** පිළිබඳ විවරණ සපයන්න.

අ. තෝමස් අල්වා එඩිසන් - Thomas Alva Edison

ආ. ලුමියර් සහෝදරයෝ - Lumiere Brothers

ඇ. සර්ජි. එම්. අයිසන්ස්ටයින් - Sergei M. Eisenstein

ඈ. ජෝර්ජ් මෙලියස් - George Melies